# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**විජේරත්න මුදියන්සේලාගේ**
**දස්කොන් බණ්ඩාර අබේරත්න**
**අංක 11,**
**උඩුවෙල පාර,**
**අම්පිටිය**

**අභියාචනා අංකය :**

**RTIC Appeal No/ 764/2022**

අභියාචක

එදිරිව

**ශ්‍රී ලංකා කෘෂිකාර්මික**
**පර්යේෂණ ප්‍රතිපත්ති සභාව**
**114/9,**
**විජේරාම මාවත,**
**කොළඹ 07**

පොදු අධිකාරිය

**ඉදිරිපිටදී** :
1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ /තොරතුරු නිලධාරි චන්ද්‍රා පද්මිණී මිය සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - 2022.10.21

**විභාග කළ දිනය** : 2022.11.02

**තීරණය කළ දිනය** : 2022.11.02

**<u>තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු.**

අභියාචක විසින් 2022.03.12 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*අ.) "2022 මාර්තු මස වන විට පොදු අධිකාරියේ පාලක සභාව නියෝජනය කරන සියලුම අධ්‍යක්ෂක වරුන්ගේ නම්, ඔවුන් සැම සියලු දෙනාගේ රාජකාරි තැපැල් ලිපිනයන්, රාජකාරි ඊ ලිපිනයන්, පුද්ගලික තැපැල් ලිපියන්, පුද්ගලික ඊ ලිපිනයන්, රාජකාරී දුරකථන අංක, පුද්ගලික දුරකථන අංක ඇතුළු සැම සියලු විස්තරයක්ම මා වෙත දැන ගැනීමට සලස්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

*ආ.) SL CARP ආයතනයේ මූලික විමර්ශන නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ රෝහණ අල්විස් යන අයගේ රාජකාරි තැපැල් ලිපිනයන්, රාජකාරි ඊ - ලිපිනයන්, පුද්ගලික තැපැල් ලිපියන්, පුද්ගලික ඊ ලිපිනයන්, රාජකාරී දුරකථන අංක, පුද්ගලික දුරකථන අංක ඇතුළු සැම සියලු විස්තරයක්ම මා වෙත දැන ගැනීමට සලස්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

*ඉ.) SL CARP ආයතනයේ විධිමත් විනය නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ ඒක පුද්ගල විනිසුරු කීර්ති විශ්වනාථ යන අයගේ රාජකාරි තැපැල් ලිපිනයන්, රාජකාරි ඊ ලිපිනයන්, පුද්ගලික තැපැල් ලිපියන්, පුද්ගලික ඊ ලිපිනයන්, රාජකාරී දුරකථන අංක, පුද්ගලික දුරකථන අංක ඇතුළු සැම සියලු විස්තරයක්ම මා වෙත දැන ගැනීමට සලස්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

*ඊ.) SL CARP ආයතනයේ විධිමත් විනය පරීක්ෂණ කටයතු වලදී පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරී ලෙස කටයුතු කල එම්.පී. විජේසිංහ යන අයගේ රාජකාරි තැපැල් ලිපිනයන්, රාජකාරි ඊ ලිපිනයන්, පුද්ගලික තැපැල් ලිපියන්, පුද්ගලික ඊ ලිපිනයන්, රාජකාරී දුරකථන අංක, පුද්ගලික දුරකථන අංක ඇතුළු සැම සියලු විස්තරයක්ම මා වෙත දැන ගැනීමට සලස්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

*උ.) SL CARP ආයතනයේ මූලික විමර්ශන නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ රෝහණ අල්විස්, SL CARP ආයතනයේ විධිමත් විනය නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ ඒක පුද්ගල විනිසුරු කීර්ති විශ්වනාථ සහ SL CARP ආයතනයේ විධිමත් විනය පරීක්ෂණ කටයුතු වලදී පැමිණිල්ල මෙහෙය වීමේ නිලධාරී ලෙස කටයුතු කල එම්.පී. විජේසිංහ යන අයවලුන් ගේ සේවය SL CARP ආයතනය තවම ලබා ගන්නේද?*

*ඌ.) SL CARP ආයතනයේ මූලික විමර්ශන නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ රෝහණ අල්විස්, SL CARP ආයතනයේ විධිමත් විනය නිලධාරී ලෙස කටයුතු කරනු ලැබූ ඒක පුද්ගල විනිසුරු කීර්ති විශ්වනාථ සහ SLCARP ආයතනයේ විධිමත් විනය පරීක්ෂණ කටයුතු වලදී පැමිණිල්ල මෙහෙය වීමේ නිලධාරී ලෙස කටයුතු කල එම්.පී. විජේසිංහ යන අයවලුන් තවම ජීවත්ව සිටින්නේද?*

*එ.) වර්තමානයේ ආයතන ප්‍රධානියා ලෙසට ස්ථිර සේවක පිරිවිතරය (carder) අනුව ලේකම්/අධ්‍යක්ෂක ලෙසට සේවය කරන නිලධාරියාගේ නම.*

*ඒ.) වර්තමානයේ ආයතන ප්‍රධානියා ලෙසට ස්ථිර සේවක පිරිවිතරය (carder) අනුව ලේකම්/ අධ්‍යක්ෂක ලෙසට සේවය කරන නිලධරයාගේ රාජකාරි තැපැල් ලිපිනයන්, රාජකාරි ඊ*

*ලිපිනයන්, පුද්ගලික තැපැල් ලිපියන්, පුද්ගලික ඊ ලිපිනයන්, රාජකාරී දුරකථන අංක, පුද්ගලික දුරකථන අංක ඇතුළු සෑම සියලු විස්තරයක්ම මා වෙත දැන ගැනීමට සලස්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

*ඔ.) වර්තමානයේ ආයතන ප්‍රධානියා ලෙසට ස්ථිර සේවක පිරිවිතරය (carder) අනුව ලේකම්/ අධ්‍යක්ෂක ලෙසට සේවය කරන නිලධාරියා පාලක සභාව නියෝජනය කිරීම සඳහා වර්තමානයේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ එකගතාවය ලිඛිතව ලබාගෙන ඇති බව ඔප්පු කිරීමට අදාල ලේඛනයන් "මුල් පිටපතේ සත්‍ය සටහනක් හෝ ලේඛනයක් බවට සහතික කර ඉල්ලුම්කරු වන මා වෙත නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි".*

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.04.04 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම්කළ නිළධාරියා විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.04.22 වන දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.10.21 දිනැතිව කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් පහත පරිදි කරුණු දක්වා ඇත.

*"........ඒ අනුව ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා විසින් අප වෙත 2022.03.12 වන දින යොමු කරන ලද අපගේ ලියාපදිංචි අංක RTI/2022/02 දරණ තොරතුරු ඉල්ලීමේ අයදුම්පත්‍රයට හා 2022.04.04 දිනැති අභියාචනාවට පිළිතුරු වශයෙන් අදාළ තොරතුරු 2022.05.04 දින ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා වෙත යොමු කර ඇති බව දන්වා සිටිමි."* (ඇමුණුම 01)

**සළකා බැලීම**

මෙම තොරතුරු ඉල්ලීමට අදාළව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉදිරිපත් කරන ලද අභියාචනයටද නම් කළ නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැත. කොමිෂන් සභාව වෙත අභියාචනය ඉදිරිපත් කිරීමෙන් පසුව පොදු අධිකාරිය විසින් 2022.10.21 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් අදාළ තොරතුරු 2022.05.04 දින අභියාචක වෙත යොමු කර ඇති බවට සඳහන් කර ඇත. එසේ වුවත්, එහි පිටපතක් කොමිෂන් සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කර නොමැත.

අභියාචකගේ ස්ථාවරය වූයේ සියලුම තොරතුරු ලබා දී නොමැති බවය. යම් යම් තොරතුරු ලබා දී ඇතත්, ඒවා ප්‍රමාණවත් නොවන බවද ඔහු සඳහන් කරයි. මෙම කරුණු ප්‍රතික්ෂේප කිරීම සඳහා පොදු අධිකාරියෙන් සාක්ෂි ඉදිරිපත් වී නොමැත.

එබැවින් ඉහත කරුණු සළකා බලා ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු 2022.11.25 දිනට ප්‍රථම, කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට අපි තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ

අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිළධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.
මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.